





කාලය ඉතා සෙමින් ගලා යන්නා සේ අනුරාධට දැනුණි. ඔහු විනාඩියෙන් විනාඩිය සිය අත් ඔරලෝසුව දෙස බැලුවේ ය.

''කලබල නොවී හිටපන්...'' සුනෙත් කීප වතාවක් ම අනුරාධ ට කීවේ ඔහුගේ නොසන්සුන් බව වටහා ගෙන ය.

දිලීප නිෂාඩි සමගින් ගුවන් තොටට පැමිණියේ අවසාන විනාඩියේ දී ය. රෝද පුටුවක වාඩි වී සිටි නිෂාඩි අනුරාධ ඈත තියාම දුටුවේ ය. ඔහු සුනෙත් ගේ උරහිස දැඩිව මිරිකා ගත්තේ ය.

''ඒ මිනිහට පේන්න ඉන්න එපා.. මොකටද මේ වෙලාවෙ අනවශ්‍ය ප්‍රශ්න හදා ගන්නෙ..'' සුනෙත් අවවාද කළේ ය. දිලීප නිෂාඩි හා සමඟින් ඔවුන් පසුකර යන විට අනුරාධ සිටියේ සුනෙත්ට මුවා වී ගත්වනම ය.

අනුරාධ ගුවන් තොටට එනු ඇතැයි යන සැකය නිෂාඩි තුළ ද විය. අවසන් වතාවට ඔහු දැක ගැනීමේ නිමක් නැති ආශාව ඇගේ සිත තුළ ද විය. ඔහු හමු වී එකම වචනයක් කතා කරන්නට නොලැබුනොත් අවම වශයෙන් දැක ගන්නට හෝ ඇයට අවශ්‍ය විය.

ඔවුන් පසු කර යන මොහොතේ නිෂාඩි වහා සුනෙත් හඳුනා ගත්තා ය. හැරී බලන්නට හැකියාවක් නොවුණ ද සුනෙත් ට මුවා වී සිටියේ අනුරාධ බව ඇයට විශ්වාස ය.

අවසන් වතාවට ඔහු ගේ දෑත් අල්ලාගෙන ''මම ගිහින් එන්නම් අනුරාධ'' යි කියන්නට ඇයට අවශ්‍ය විය. එනමුදු ඔහු දෙස හැරී බලන්නට වත් අවකාශයක් නොමැති මේ මොහොතේ කුමක් කරන්නදැයි ඇයට සිතාගත නොහැකි විය. ඇගේ දෑස් කඳුළින් පිරී ගියේ ය.

> *මා දිහා ආදරෙන් බලා යළි හිනැහෙන්න*
> *තාරකා විජිතයේ මොහොතකට හමුවෙන්න*
> *නෙතු පුරා රැඳි සෙනෙහෙ කෙතරම්ද පවසන්න*
> *අපි අපේ වන තුරුම රත්තරං ඉවසන්න..*

දිලීප රෝද පුටුව අතහැර විගමන පත්‍රිකා පුරවන්නට පටන් ගත් අවසරයෙන් නිෂාඩි අනුරාධ දෙසට හැරුණා ය. ඈත සිට අසරණ ලෙස තමා දෙස බලා සිටිනා අනුරාධ ගේ දසුන ඇගේ සිත කම්පාවට පත් කළේ ය.

''අනුරාධ...'' ඇය මිමිණුවා ය. ඇගේ ඇසින් වට කඳුළක් දෙකොපුල් ඔස්සේ ගලා ගියේ ය. තව දුරටත් ඈතට වී ඇය දෙස බලා සිටින්නට ශක්තියක් අනුරාධට නොවී ය. සුනෙත් ඔහු වළක්වන්නට තැත්කරද්දී ම අනුරාධ නිෂාඩි වෙත ආවේ ය. කවුරුන් බලා සිටින්නේ ද කියා සිතන්නට හෝ උවමනාවක් ඔහුට නොවී ය. ඇගේ රෝද පුටුව ඉදිරියේ පහත් වූ ඔහු ඇගේ දෝතම රැගෙන සිප ගත්තේ ය.

''කොතැන හිටියත් මං ඔයා හොයා ගෙන එනවා..'' ඔහු මිමිණුවේ ය.

''කොතැන හිටියත් මං ඔයා වෙනුවෙන් බලා ඉන්නවා..'' ඇය ද කීවා ය. ඇගේ දෑත නැවත වතාවක් සිපගත් අනුරාධ ආපසු හැරුණේ ය. ඒ මොහොතේ දිලීප මුහුණට මුහුණ හමු වනු ඇතැයි ඔහු කිසි විටෙක නොසිතුවේ ය. දෙදෙනාම තත්පර කීපයක් එකිනෙකා දෙස බලාගත්වන ම සිටිය හ.

''ප්ලීස් ලීව් අස් අලෝන්..'' අවසන දිලීප ඉතා පැහැදිලි හඬකින් කීවේ ය. ඔහුගේ දෑස් කෝපාග්නියෙන් දැවෙමින් තිබුණේ යයි අනුරාධට සිතුණි.

> *ජනකාන්ත නලුවා ප්‍රේමය වෙනුවෙන් රංගනය අතහරියි කියලා කියන්න වෙයිද දන්නෙ නැහැ.. අනේ එහෙම නම් කරන්න එපා.. රටේ කෙල්ලො අඬලා අඬලා සියදිවි නසා ගනියි..*

අනුරාධ පසෙකට විය. දිලීප රෝද පුටුව ද තල්ලු කරගෙන ප්‍රවේශපත් කවුන්ටර වෙත ගියේ ය. ඔවුනට පිටුපසින් සිටි මගීන් අතර නිෂාඩි නොපෙනී ගියා ය. අනුරාධ නොසැලී ඒ සෙනග කන්දරාව දෙසම බලා සිටියේ ය. ආගමන විගමන දොරින් ඇතුළට යන මොහොතේ නිෂාඩි අවසාන වතාවට ආපසු හැරී අනුරාධ දෙස බැලුවා ය. ඒ තත්පර කීපයේ දී ඇගේ දෑසින් කියැවුණ මහ දිග කතාව අනුරාධ ගේ හදවත පත්ලේ ම තැන්පත් විය.

''මම ඔයා වෙනුවෙන් ඉන්නවා...'' ඇය මුමුණා කිව්වේ ඒ වචන නොවේ ද? ඇයට යමක් කියන්නට ඉඩක් නොමැති වීමේ වේදනාව ඔහු සිත කීරි ගස්සයි.

නිෂාඩි නොපෙනී ගිය පසු ද ආපසු

> *ඇය පිළිබඳ නොසන්සිඳෙන මහා තෘෂ්ණාව විසින් තමා අතරමං කරනු ලැබ ඇති බවක් ඔහුට දැනෙයි. වෛර කළ යුතු මොහොත් දී එසේ කරන්නට තරම් ශක්තියක් තමා තුළ නැත්තේ ඒ තෘෂ්ණාව නිසා නොවේ ද?*

හැරෙන්නට නිනව්වක් නැතිව අනුරාධ හුන් තැනටම වී බලා සිටියේ ය.

වේදනාවෙන් පීඩිත වූ සිත හඬා වැටෙයි. ජීවිතය නම් වූ ගමන මේ තරම් කටුක වේ යයි අනුරාධ සිහිනෙකිනුදු නොසිතුවේ ය. මේ තරම් පීඩාවක් මේ තරම් තැවීමක් කෙසේ නම් ඉවසා සිටින්න ද? ඇය සිහිනයක් සේ පැමිණි යා ය. සිහිනයක් සේ ඉවත්ව ගියා ය. අත පෙවිය නොහැකි මානයකට ඇය රැගෙන යනු ලැබූ බව කෙසේ නම් විශ්වාස කරන්නද?

ලෝකාන්තයේ දී ඇය හමු වූ සොඳුරු

ගල් පිළිමයක් සේ බලා සිටියේ ය.

00000000

සිංගප්පූරු ගුවන් තොටට යානය ගොඩ බසින තෙක්ම දිලීප හා නිෂාඩි අතර එක වචනයක් හෝ හුවමාරු නොවී ය. වරින් වර ගුවන් සේවිකාවන් ගෙන ආ ආහාර පවා නිෂාඩි ප්‍රතික්ෂෙප කළා ය. දිලීප වරින් වර ඇය දෙස බැලුවා විනා කතාවකට වැටෙන්නට උත්සාහ නොකළේ ය.

සියලු සිදුවීම් විසින් ඔහු පීඩාවට පත් කරනු ලැබ තිබුණි. මේ සියල්ල පිළිබඳව ඇය හා කෙළින් කතා කරන්නට ඇත්නම් කෙතරම් සැනසිල්ලක් ද...?

මො-
හොත අනුරාධට සිහිපත් වෙයි. ඒ නිමේෂය සිය ජීවිතය උඩු යටිකුරු කරන බව ඒ මොහොතේ සිහිනෙන් වත් සිතුණා ද? මේ ගෙවා දමමින් සිටින්නේ ආත්ම ගණනාවක් ගෙවා ආ ගමනක තවත් එක් කොටසක් ම නොවේ ද? ආත්ම ගණනාවක් පතා ආ ඇය අහම්බයකින් හමු වී මේ තරම් ඉක්මනින් වෙන්වන්නට සිදුවීම කොයි තරම් කුරිරු ද?

''අපි යමු..'' යි සුනෙත් කියන තුරුම අනුරාධ

නිෂාඩි නින්දේ ය. එසේ නොවේ නම් ඇය ඇස් පියාගත්වන ම කල්පනාවක ය. ඇය දෙස හැරී බලන විට ඔහු සිත තුළ ඇති වන්නේ අනුකම්පාවකි. එය කිසි ලෙසකින් වත් වෛරයක් බවට පත් නොවන බව දිලීප දනියි. කිසි දිනෙක ඇයට වෛර කළ නොහැකි ය.

සුරඟනක ලෙසින් ඇය තමා සමීපයේම සිටිය යුතු ය. ඇස් මානයේ ඇති ඇගේ දසුන පවා

